**බෙස්ලයින් මාර්ග ව්‍යාපෘතිය - අදියර III - 2013**

---

බෙස්ලයින් මාර්ග ව්‍යාපෘතියේ - අදියර III , 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන , ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2009 නොවැම්බර් 19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණය යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ හා ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. කොළඹ - හොරණ මාර්ගයට සම්බන්ධ කිරීම සඳහා කිරුළපන සිට නව මාර්ගයක් ඉදිකිරීම මගින් මාර්ග ප්‍රවාහන තදබදය අවම කර ගැනීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 719 ක් වන අතර, ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යයනය කිරීම අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ කටයුතු 2009 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම**

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන , ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයේ අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම් , මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ , ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඉ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

**3. මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර මා දරන්නා වූ මතය වනුයේ,

( අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන**

------------------

**4.1 මූල්‍ය කාර්ය සාධනය**

-------------------------

මූල්‍ය ප්‍රකාශනවලට සහ විගණනයට ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.213,900 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.381,561,214 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| කෙරීගෙන යන වැඩ | 213,900 | 175,911,800 | 381,561,214 |
| | 213,900 | 175,,911,800 | 381,561,214 |

## 5. විගණන නිරීක්ෂණ

වයාපෘතිය විසින් අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

## 6. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 6.1 අරමුදල් උපයෝජනය

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | 2013 වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් |
|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ශ්‍රී ලං ර | 126.5 | 126.07 | 331.6 |
| | 126.5 | 126.07* | 331.6 ** |

* සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු මුදල් වලින් රු.125,880,000 ක් වූ ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීම හේතුවෙන් හා පසුගිය වර්ෂයේ අත්තිකාරම් මුදල් වලින් රු.20,275 ක් අයකර ගැනීම හේතුවෙන් මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන මුදල සමඟ මෙම මුදල එකඟ නොවේ.

** 2012 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.50,000,000 ක් වූ වන්දි මුදල් සහ රු.51,963 ක් වූ අත්තිකාරම් හා පූර්ව ගෙවීම් ඇතුළත් නොකිරීම හේතුවෙන් මෙම මුදල මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන මුදල සමඟ එකඟ නොවේ.

### 6.2 භෞතික කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බෙස්ලයින් මාර්ගය වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘතියේ III අදියර ලෙස ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියේ කටයුතු 2009 වර්ෂයේදී ආරම්භ කර තිබුණද කිරුළපන සිට නව මාර්ගය ඉදිකිරීම් පිළිබඳව 2012 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් පිළිබඳ ප්‍රගතියක් දක්වා නොතිබුණි. තවද සමස්ථ ව්‍යාපෘති සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම අදාළ තොරතුරු සමඟ ව්‍යාපෘතිය විසින් පිළියෙල කර නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මාර්ග ඉදිකිරීම් වැඩ නිම කිරීමේ දිනය තීරණය කළ නොහැකි විය.

(ආ) ලැබී ඇති තොරතුරු අනුව, මෙම ව්‍යාපෘතිය යටතේ අවතැන් වූ පුද්ගලයන් සඳහා නිවාස යෝජනා ක්‍රමයක් සැලසුම් කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2008 වර්ෂයේදී රු.1,175,300 ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණි. කෙසේ වුවද 2013 දෙසැම්බර් 31 වන විටත් සැලසුම් සම්පූර්ණ කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඇ) හෙක්ටයාර් 2.728 ක ඉඩම් කොටස් 143 ක් අත්පත් කර ගැනීමට අපේක්ෂා කර තිබුණද, 2013 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතිය විසින් හෙක්ටයාර් 0.3447 ක ඉඩම් කොටස් 10 ක් පමණක් අත්පත් කර ගෙන තිබුණි.